# සමාජයට සහ පුද්ගලයන්ට දූෂණයේ ඇති බලපෑම සහ අවදානම

**දිනය:** 1448 මුහර්රම් 11 (2026 ජූනි 26)

සියලු ප්‍රශංසා අල්ලාහ්ට හිමිවේ. අපි ඔහුව ප්‍රශංසා කරමු, ඔහුගෙන් උදව් පතමු, තවද ඔහුගෙන් සමාව අයදිමු. අපගේ ආත්මයන්ගේ නපුරෙන් සහ අපගේ අයහපත් ක්‍රියාවන්ගෙන් ආරක්ෂාව පතා අපි අල්ලාහ් වෙත යොමු වෙමු. අල්ලාහ් මඟ පෙන්වූ අයෙකුව මුළා කිරීමට කිසිවෙකුට නොහැක, තවද ඔහු මුළා වීමට ඉඩ හැර ඇති අයෙකුට මඟ පෙන්වීමටද කිසිවෙකුට නොහැක. අල්ලාහ් හැර වෙනත් කිසිදු දෙවියෙකු නොමැති බවත්, ඔහු ඒකීය වන අතර ඔහුට සමාන කිසිවෙකු නොමැති බවත් මම සාක්ෂි දරමි. තවද මුහම්මද් (සල්) තුමාණන් ඔහුගේ ගැත්තා සහ දූතයා වන බවටද මම සාක්ෂි දරමි.

*"අහෝ විශ්වාසවන්තයිනි! ඔබ බිය විය යුතු අයුරින් අල්ලාහ්ට බිය වන්න. තවද (අල්ලාහ්ට සම්පූර්ණයෙන්ම අවනත වූ) මුස්ලිම්වරුන් ලෙස මිස මිය නොයන්න."* [ආලු ඉම්රාන්: 102]

*"අහෝ මිනිසුනි! ඔබ සැම එකම ආත්මයකින් මවා, එයින්ම ඔහුගේ සහකාරියද මවා, ඔවුන් දෙදෙනාගෙන් බොහෝ පිරිමින් හා ස්ත්‍රීන් බෝ කළ ඔබේ පරමාධිපතිට බිය වන්න. තවද යම් අල්ලාහ්ගේ නාමයෙන් ඔබ එකිනෙකාගෙන් අයිතිවාසිකම් ඉල්ලා සිටින්නේද, ඒ අල්ලාහ්ට සහ ලේ ඥාතිත්වයට (ගරු කිරීමට) බිය වන්න. නියත වශයෙන්ම අල්ලාහ් ඔබ කෙරෙහි අවධානයෙන් සිටින්නෙකු ලෙස සිටියි."* [අන්නිසා: 1]

*"අහෝ විශ්වාසවන්තයිනි! අල්ලාහ්ට බිය වන්න, තවද ඍජු (සත්‍ය) වචනම පවසන්න. (එවිට) ඔහු ඔබේ ක්‍රියාවන් ඔබට යහපත් කර දෙන්නේය, තවද ඔබේ පව් ඔබට සමාව දෙන්නේය. යමෙක් අල්ලාහ්ට සහ ඔහුගේ දූතයාට අවනත වන්නේද, ඔහු නියත වශයෙන්ම උතුම් වූ ජයග්‍රහණයක් ලබා ගත්තේය."* [අල්-අහ්සාබ්: 70, 71]

තවද නියත වශයෙන්ම වඩාත්ම සත්‍යවාදී වදන් අල්ලාහ්ගේ වදන් (කුආර්නය) වේ. වඩාත්ම යහපත් මඟ පෙන්වීම මුහම්මද් (සල්) තුමාණන්ගේ මඟ පෙන්වීමයි. කරුණු අතරින් වඩාත්ම අයහපත් දේ (දීනයේ) අලුතින් ඇති කරන ලද දේවල් (බිද්අත්) වේ. සෑම අලුතින් ඇති කළ දෙයක්ම මුළාවකි, තවද සෑම මුළාවක්ම නිරයට මඟ පෙන්වයි.

**අහෝ මුස්ලිම්වරුනි:**

අල්ලාහ් තආලා තම දූතයාණන් වන මුහම්මද් (සල්) තුමාණන්ව එවනු ලැබුවේ පෙර දූතවරුන්ගේ පැමිණීම නතර වී තිබූ, දේව ග්‍රන්ථයන්ගේ ඉගැන්වීම් අමතක වී තිබූ සහ දැඩි මිථ්‍යා (ජාහිලියියා) හා අන්ධකාර මුළාවක ගිලී සිටි සමාජයක් වෙතය. එකල ජනයා සත්‍ය සහ අසත්‍ය අතර වෙනස හෝ යහපත සහ අයහපත අතර වෙනස හඳුනා නොගත්හ. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

*"අකුරු නොදත් අය අතරින්ම කෙනෙකුව දූතයා ලෙස එවූයේ ඔහුමය. ඔහු ඔවුන්ට ඔහුගේ වැකි පාරායනය කර පෙන්වයි, ඔවුන්ව පවිත්‍ර කරයි, තවද ඔවුන්ට ග්‍රන්ථය හා ප්‍රඥාව උගන්වයි. නියත වශයෙන්ම ඔවුන් මීට පෙර පැහැදිලි මුළාවක සිටියහ."*[අල්-ජුම්ආ: 2]

අල්ලාහ් ඒ තුමාණන් මාගර්යෙන් මිනිසුන්ව මුළාවෙන් මුදවා මඟ පෙන්වූයේය, අන්ධකාරයෙන් පසුව පෙනීම ලබා දුන්නේය. ඒ තුමාණන්ගේ දේශනාව අනුගමනය කිරීමෙන් මිනිස් ආත්මයන් පවිත්‍ර වූ අතර ඉස්ලාම් දහම තුළින් හදවත් ඍජු විය. නබි (සල්) තුමාණන්ගේ පැමිණීමත් සමඟ අවධාරණය කළ සහ ඊට පටහැනිව ක්‍රියා කිරීමෙන් වැළකී සිටින ලෙස අනතුරු ඇඟවූ වැදගත්ම ඉස්ලාමීය ප්‍රතිපත්තියක් වන්නේ: අසාධාරණය, දූෂණය සහ විනාශය (ෆසාද්) තහනම් කිරීම සහ ඒවාට එරෙහිව සටන් කිරීමේ අනිවායර්තාවයයි.

අල්ලාහ් තආලා මෙසේ පවසයි:

*"භූමිය යහපත් කරනු ලැබූවායින් පසුව එහි විනාශයක් (දූෂණයක්) නොකරන්න."* [අල්-අඃරාෆ්: 56]

තවද උන්වහන්සේ මෙසේද පවසයි:

*"තවද ඔහු (ඔබෙන්) ඉවත් වූ විට, භූමියේ විනාශය ඇති කිරීමටත්, වගාවන් සහ සත්ව පරපුර විනාශ කිරීමටත් වෙහෙසෙයි. අල්ලාහ් විනාශයට (දූෂණයට) ප්‍රිය කරන්නේ නැත."*[අල්-බකරා: 205]

මුජාහිද් (රහිමහුල්ලා) පවසන්නේ: *(යමෙක් භූමිය මත දූෂණය හා විනාශය ව්‍යාප්ත කිරීමට උත්සාහ කරන්නේද, අල්ලාහ් වැස්ස වළක්වයි, එවිට වගාවන් සහ සත්ව පරපුර විනාශ වී යයි).*

**මුස්ලිම් ප්‍රජාවනි:**

අල්ලාහ් සුබුහානහු වතආලා භූමියේ දූෂණය සිදු කිරීම ගැන අනතුරු අඟවා ඇති අතර, එහි සෑම ආකාරයක්ම හෙළා දැක ඇත: එනම් මිනිස් ජීවිත, පරම්පරාව, ධනය, බුද්ධිය සහ දහම දූෂණය කිරීමයි. එය මහා පාපයක් ලෙස සලකා ඇති අතර, එය සිදු කරන්නන් අල්ලාහ්ගේ ශාපයට සහ දැඩි දඬුවමට ලක්වන බව පවසා ඇත.

*"කවුරුන් අල්ලාහ් සමඟ ගිවිසුම් ඇති කර ගැනීමෙන් පසුව එය කඩ කරන්නේද, තවද අල්ලාහ් එක් කිරීමට අණ කළ දේ (ඥාති සබඳතා) කපා හරින්නේද, තවද භූමියේ දූෂණය ඇති කරන්නේද, ඔවුන්ට ශාපය හිමිවේ, තවද ඔවුන්ට ඉතා අයහපත් නවාතැන (නිරය) ඇත."*[අර්-රඃද්: 25]

දූෂණයේ වඩාත්ම භයානක සහ සමාජයට මෙන්ම පුද්ගලයන්ට දැඩිම බලපෑමක් එල්ල කරන ස්වරූපය වන්නේ: මිනිසුන්ගේ ප්‍රතිපත්ති (අකීදාව) දූෂණය කිරීම, බිද්අත් (අලුත් දෑ) ව්‍යාප්ත කිරීම සහ පාපී ක්‍රියාවන්ට අනුබල දීම තුළින් ඔවුන්ව දහම පිළිබඳව මුළා කිරීමයි.

*"භූමියේ දූෂණය නොකරන්නැයි ඔවුන්ට කියනු ලැබූ විට, 'අපි ප්‍රතිසංස්කරණය කරන්නන් (යහපත කරන්නන්) පමණි' යැයි ඔවුහු පවසති."* [අල්-බකරා: 11]

මුජාහිද් (රහිමහුල්ලා) පවසන්නේ: *(ඔවුන් අල්ලාහ්ට අකීකරු වෙමින් පාප ක්‍රියාවන්හි යෙදෙන විට, 'මෙසේ නොකරන්න' යැයි පැවසුවහොත්, 'අපි සිටින්නේ නිවැරදි මඟෙහිය, අපි යහපත කරන්නන් වෙමු' යැයි ඔවුහු පවසති).*

**මුස්ලිම් ප්‍රජාවනි:**

වඩාත්ම අවදානම් සහගත පරීක්ෂාවන් සහ දැඩිම හානියක් ගෙන දෙන ව්‍යසනයක් වන්නේ මූල්‍ය දූෂණයයි. ඉස්ලාමය මෙහි අයහපත් ප්‍රතිඵල පිළිබඳව දැඩි ලෙස අනතුරු අඟවා ඇත.

*"ඔබේ ධනය සහ ඔබේ දරුවන් පරීක්ෂාවක් පමණක් බවත්, නියත වශයෙන්ම අල්ලාහ් සන්තකයෙහි මහා කුලියක් ඇති බවත් දැනගන්න.*

*"*[අල්-අන්ෆාල්: 28]

කඃබ් බින් ඉයාද් (රළියල්ලාහු අන්හු) තුමා පවසයි: නබි (සල්) තුමාණන් මෙසේ පවසනු මම ඇසුවෙමි: «සෑම උම්මතයකටම (ප්‍රජාවකටම) පරීක්ෂාවක් ඇත, මාගේ උම්මතයේ පරීක්ෂාව ධනයයි». [තිර්මිදී]

මූල්‍ය දූෂණයේ එක් ප්‍රධාන ස්වරූපයක් වන්නේ අල්ලස (Bribery) ව්‍යාප්ත වීමයි. අල්ලස යම් සමාජයක ව්‍යාප්ත වුවහොත්, එය එම සමාජයේ මිනිසුන්ගේ හෘද සාක්ෂිය දූෂණය කරයි, විශ්වාසයේ ආලෝකය නිවා දමයි. එම නිසා අල්ලස් ගන්නා සහ දෙන අයට ඉස්ලාමයේ දැඩි අනතුරු ඇඟවීම් සහ දඬුවම් ප්‍රකාශ කර ඇත. යුදෙව්වන්ගේ ලක්ෂණ පවසමින් අල්ලාහ් මෙසේ පවසයි:

*"ඔවුහු බොරුවලට දැඩි ලෙස සවන් දෙන්නෝය, තහනම් දෑ (සුහ්ත්) අධික ලෙස අනුභව කරන්නෝය."* [අල්-මාඉදා: 42]

හසන් අල්-බස්රි සහ කතාදා (රහිමහුමල්ලා) 'සුහ්ත්' යන්නෙහි තේරුම 'අල්ලස' ලෙස දක්වා ඇත. අබ්දුල්ලාහ් බින් අම්ර් (රළියල්ලාහු අන්හුමා) පවසයි: «අල්ලස් දෙන්නාට සහ අල්ලස් ගන්නාට රසූලුල්ලාහ් (සල්) තුමාණන් ශාප කළහ». [අබූ දාවූද්, තිර්මිදී]. 'ශාපය' යනු අල්ලාහ්ගේ කරුණාවෙන් (රහ්මතයෙන්) ඈත් කිරීමයි. මහා කරුණාවන්ත වූ අල්ලාහ්ගේ ශාපයට ලක්වූවෙකුට බලාපොරොත්තු විය හැකි ලාභය හෝ වාසිය කුමක්ද?

අහෝ අල්ලාහ්ගේ ගැත්තනි, ෂෙයිතාන් දුවර්ල ඇදහිල්ලක් ඇති අය මුළා කිරීම සඳහා අල්ලසට විවිධ නම් තබා ඇත. ඉන් එකක් වන්නේ සේවකයන් හෝ නිලධාරීන් ලබන 'තෑගි' ය. අබූ හුමෛද් අස්-සාඉදී (රළියල්ලාහු අන්හු) පවසයි: නබි (සල්) තුමාණන් සදකා (බදු) එකතු කිරීම සඳහා ඉබ්නුල් ලුත්බියියා නැමැති අයෙකු පත් කළේය. ඔහු ආපසු පැමිණි විට: "මෙය ඔබට අයිති දේ, තවද මෙය මට ලැබුණු තෑගි" යැයි පැවසීය. එවිට නබි (සල්) තුමාණන් මින්බරයට නැඟ අල්ලාහ්ව ප්‍රශංසා කර මෙසේ පැවසූහ: «අප විසින් පත් කර යවනු ලබන නිලධාරියාට කුමක් වීද? ඔහු පැමිණ 'මෙය ඔබටය, මෙය මට තෑගි ලැබුණි' යැයි පවසයි. ඔහු තමාගේ මවගේ සහ පියාගේ නිවසට වී සිටියේ නම්, ඔහුට තෑගි ලැබෙන්නේද නැද්ද කියා බැලීමට තිබුණා නොවේද? මාගේ ප්‍රාණය යමෙකුගේ අතෙහි තිබේද ඔහු මත දිවුරා පවසමි, ඔහු (අයුතු ලෙස) ලබාගත් ඕනෑම දෙයක් අවසන් විනිශ්චය දිනයේදී තමාගේ බෙල්ල මත තබාගෙන පැමිණෙනු ඇත». [බුහාරි, මුස්ලිම්]

**අල්ලාහ්ගේ ගැත්තනි:**

මූලා‍ය දූෂණයේ තවත් ස්වරූපයක් වන්නේ වංචාවෙන්, සොරකමෙන් සහ අල්ලසින් මුදල් ඉපයීමයි.

*"ඔබ අතර අන් අයගේ ධනය අයුතු ලෙස (බාතිල් ක්‍රමවලින්) අනුභව නොකරන්න."* [අල්-බකරා: 188]

අල්-කුතර්බි පවසන්නේ: *(යමෙක් අන් අයගේ ධනය ෂරීආනුකූල අවසරයකින් තොරව ලබා ගන්නේද, ඔහු එය අයුතු ලෙස අනුභව කර ඇත).* අල්ලාහ් තආලා මෙවැනි අය වෙනුවෙන් අවසන් දිනය දක්වා පාරායනය කරනු ලබන සූරාවක් (පරිච්ඡේදයක්) පහළ කරමින් දැඩි දඬුවම් ප්‍රකාශ කර ඇත:

*" කිරුම් සහ මිනුම්වලින් වංචා කරන්නන්ට විනාශය වේවා! ඔවුහු මිනිසුන්ගෙන් මැන ගන්නා විට සම්පූර්ණයෙන්ම මැන ගනිති. නමුත් ඔවුන් අන් අයට මැන හෝ කිරා දෙන විට අඩු කර දෙති. ඔවුන් නැවත නැගිටුවනු ලබන බව ඔවුහු නොසිතන්නාහුද? මහා දවසක් සඳහා, එදින මිනිසුන් ලෝකාධිපති ඉදිරියෙහි පෙනී සිටිනු ඇත."* [අල්-මුතෆ්ෆිෆීන්: 1-6]

බව්ලා බින්ත් කයිස් (රළියල්ලාහු අන්හා) පවසයි: නබි (සල්) තුමාණන් මෙසේ පවසනු ඇසුවෙමි: «නියත වශයෙන්ම සමහර මිනිසුන් අල්ලාහ්ගේ ධනය (පොදු ධනය) අයුතු ලෙස පරිහරණය කරති, විනිශ්චය දිනයේදී ඔවුන්ට හිමිවන්නේ නිරයයි». [බුහාරි]

**අහෝ මුඃමින්වරුනි (විශ්වාසවන්තයිනි):**

දූෂණය ව්‍යාප්ත වීම යනු හුදෙක් මූලා‍ය හෝ පරිපාලනමය වැරැද්දක් පමණක් නොවේ. එය සමාජයක් විනාශ කර දමන දරුණු රෝගයකි. ඉතිහාසයේ බිඳ වැටුණු සෑම ශිෂ්ටාචාරයකටම මුල් වූයේ දූෂණය සහ අසාධාරණයයි.

*"මිනිසුන්ගේ අත්වලින් උපයා ගත් (නපුරු) දේ හේතුවෙන් ගොඩබිමෙහි සහ මුහුදෙහි දූෂණය (විනාශය) ප්‍රකාශ විය. ඔවුන් කළ සමහර ක්‍රියාවන්හි රසය ඔවුන්ට විඳීමට සැලැස්වීම සඳහාය, ඔවුන් (යහපත් මඟට) හැරෙනු පිණිසය."* [අර්-රූම්: 41]

ඕ අල්ලාහ්! අපට හලාල් (අනුමත) දේ ප්‍රමාණවත් කර, හරාම් (තහනම්) දේවලින් අපව ආරක්ෂා කරනු මැනව. ඔබගේ අනුග්‍රහයෙන් ඔබ හැර අන් අයගෙන් අපව ස්වාධීන කරනු මැනව. අල්ලාහ් මටත් ඔබටත් මහා කුර්ආනයෙන් ආශිර්වාද කරත්වා. මාගේ මේ වදන් පවසා මම අල්ලාහ්ගෙන් සමාව අයදිමි. නියත වශයෙන්ම ඔහු බොහෝ සේ සමාව දෙන්නෙක් සහ මහා කරුණාවන්තයෙක් වේ.

## දෙවන දේශනය

සියලු ප්‍රශංසා ලෝකාධිපති අල්ලාහ්ට හිමිවේ. අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැති බව මම සාක්ෂි දරමි. මුහම්මද් (සල්) තුමාණන් ඔහුගේ ගැත්තා සහ දූතයා වන බව සාක්ෂි දරමි.

තවද මම ඔබටත් මටත් අල්ලාහ් කෙරෙහි ඇති බිය (තක්වා) උපදවා ගන්නා ලෙස අවවාද කරමි. යමෙක් අල්ලාහ්ට බිය වන්නේද, ඔහුව අල්ලාහ් ආරක්ෂා කරන්නේය.

**මුස්ලිම් ප්‍රජාවනි:**

ඉස්ලාමීය සමාජය අනෙකුත් ජාතීන් අතර උතුම්ම ජාතිය බවට පත්වූයේ එහි ජනගහනය හෝ ආයුධ බලය නිසා නොවේ. එය සිදුවූයේ අල්ලාහ්ගේ අණ පිළිපදිමින්, යහපත අණ කිරීම සහ අයහපත වැළැක්වීම යන වගකීම ඉටු කිරීම නිසාය.

*"මිනිස් වර්ගයා වෙනුවෙන් බිහි කරන ලද උතුම්ම ප්‍රජාව ඔබ වන්නෙහිය. ඔබ යහපත අණ කරන්නෙහුය, අයහපත වළක්වන්නෙහුය, තවද අල්ලාහ්ව විශ්වාස කරන්නෙහුය."* [ආලු ඉම්රාන්: 110]

අයහපත වැළැක්වීම යනු අතිරේක හෝ කැමති නම් පමණක් කරන දෙයක් නොවේ. එය සෑම දෙනාගේම අනිවාර්ය වගකීමකි. එය සමාජය නමැති නැව ගිලී යාමෙන් වළක්වන ආරක්ෂක වැටකි. සමාජයේ සිටින මෝඩයන් සහ දූෂිතයන් එම නැව සිදුරු කරන විට, යහපත් මිනිසුන් නිහඬව සිටියහොත් මුළු නැවම ගිලී සැවොම විනාශ වනු ඇත. නමුත් ඔවුන්ව වැළැක්වුවහොත් සැවොම බේරෙනු ඇත.

එබැවින්, ඔබ යම් අයහපතක් හෝ දූෂණයක් දුටුවහොත්, ඒ පිළිබඳව නිවැරදිව තහවුරු කරගෙන, නීත්‍යානුකූල ක්‍රමවේද ඔස්සේ එය වැළැක්වීමට කටයුතු කළ යුතුය. නබි (සල්) තුමාණන් මෙසේ පවසා ඇත: «ඔබ අතරින් කවුරුන් හෝ අයහපතක් දුටුවහොත්, ඔහු එය තමාගේ අතින් (බලයෙන්) වෙනස් කරත්වා. ඊට ශක්තිය නැත්නම් තමාගේ දිවෙන් (වචනයෙන්) වෙනස් කරත්වා. ඊටත් ශක්තිය නැත්නම් තමාගේ හදවතින් (එය පිළිකුල් කරත්වා). එය ඇදහිල්ලේ (ඊමාන්හි) දුර්වලම අවස්ථාවයි». [මුස්ලිම්]

**ඉස්ලාමීය සහෝදරවරුනි:**

දූෂිතයන් දෙස බලා නිහඬව සිටීම මුළු සමාජයටම අල්ලාහ්ගේ දඬුවම සහ කෝපය පැමිණීමට හේතුවකි.

*"බනූ ඉස්රායීල්වරුන් අතරින් ප්‍රතික්ෂේප කළ අයට දාවූද් සහ ඊසා බින් මයර්ම්ගේ දිවෙන් ශාප කරනු ලැබීය. ඒ ඔවුන් අකීකරු වූ බැවින් සහ සීමාව ඉක්මවා ගිය බැවිනි. ඔවුහු තමන් කළ අයහපත් ක්‍රියාවලින් එකිනෙකාව වැළැක්වූයේ නැත. ඔවුන් කළ දේ ඉතාමත් අයහපත්ය."* [අල්-මාඉදා: 78, 79]

දූෂණයට එරෙහිව සටන් කිරීම, සමාජයේ සදාචාරය ආරක්ෂා කිරීම සහ විනිවිදභාවය ඇති කිරීම ආගමික මෙන්ම ජාතික වගකීමකි. අපි සැවොම එක්ව දූෂණයට එරෙහිව නැගී සිටිය යුතුය. නබි (සල්) තුමාණන් පැවසූහ: «ඔබේ සහෝදරයා අසාධාරණ කරන්නෙකු වුවද, අසාධාරණයට ලක්වූවෙකු වුවද ඔහුට උදව් කරන්න». එවිට කෙනෙකු ඇසීය: "ඕ අල්ලාහ්ගේ දූතයාණනි! ඔහු අසාධාරණයට ලක්වූවෙකු නම් උදව් කරමි, නමුත් අසාධාරණයක් කරන්නෙකු නම් ඔහුට උදව් කරන්නේ කෙසේද?" නබි තුමා පැවසූහ: «ඔහුව අසාධාරණය කිරීමෙන් වැළැක්වීම තුළිනි. නියත වශයෙන්ම එය ඔහුට කරන උදව්වකි». [බුහාරි]

අබූ බකර් අස්-සිද්ධීක් (රළියල්ලාහු අන්හු) තුමා පැවසීය: "ජනයෙනි, ඔබ මෙම වැකිය පාරායනය කරන්නෙහුය: '*අහෝ විශ්වාසවන්තයිනි! ඔබ ඔබව ආරක්ෂා කරගන්න, ඔබ ඍජු මඟෙහි සිටින්නේ නම් මුළා වූවන්ගෙන් ඔබට කිසිදු හානියක් සිදු නොවේ*' [අල්-මාඉදා: 105]. නමුත් නබි (සල්) තුමාණන් මෙසේ පවසනු මම ඇසුවෙමි: «නියත වශයෙන්ම මිනිසුන් අසාධාරණ කරන්නෙකුව දැක, ඔහුව නොවැළැක්වූවහොත්, අල්ලාහ් ඔවුන් සැමට පොදුවේ දඬුවම් කිරීමට බොහෝ සෙයින් ඉඩ ඇත»". තවත් වාතර්ාවක: «මාගේ ප්‍රාණය යමෙකුගේ අතෙහි තිබේද ඔහු මත දිවුරා පවසමි, ඔබ නියත වශයෙන්ම යහපත අණ කළ යුතුය, අයහපත වැළැක්විය යුතුය. නැතහොත් අල්ලාහ් ඔබ වෙත දඬුවමක් එවනු ඇත, ඉන්පසු ඔබ ඔහුගෙන් ප්‍රාථර්නා කළද ඒවා පිළිගනු නොලැබේ».

ඕ අල්ලාහ්! ඔබගේ ගැත්තා සහ නබිවරයා වන මුහම්මද් (සල්) තුමාට ආශිවර්ාදය හා ශාන්තිය පිරිනමනු මැනව. තවද සියලු සහාබාවරුන් කෙරෙහි තෘප්තිමත් වනු මැනව. අපට ඔබව සිහිපත් කිරීමට, ස්තුති කිරීමට සහ හොඳ අයුරින් වන්දනා කිරීමට උදව් කරනු මැනව.

ඕ අල්ලාහ්! කුවේට් දේශය සහ එහි වැසියන් සියලු නපුරෙන් සහ අයහපතෙන් ආරක්ෂා කරනු මැනව. මේ රට සහ අනෙකුත් මුස්ලිම් රටවල් සාමකාමී සහ සුරක්ෂිත රටවල් බවට පත් කරනු මැනව. අපගේ අමීවර්රයාට (පාලකයාට) සහ ඔටුන්න හිමි කුමරුට ඔබ ප්‍රිය කරන සහ තෘප්තිමත් වන දේ කිරීමට භාග්‍ය හා ශක්තිය ලබා දෙනු මැනව. තවද සියලු ප්‍රශංසා ලෝකාධිපති අල්ලාහ්ටම හිමිවේවා.

*ආදශර් සිකුරුදා දේශන සම්පාදනය කිරීමේ කමිටුව*